**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - 2017**

**------------------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------------**

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**---------------------------------**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2018 ඔක්තෝබර් 20 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වාගෙනයාම**

**---------------------------------------------------**

සංස්ථාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද, සමාලෝචිත වර්ෂයට අදාල ලෙජර් ගිණුම්, පොත්පත් හා ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

**2.3 වත්කම් හා වගකීම්වල පැවැත්ම**

**--------------------------------------**

සංස්ථාව විසින් අවසන් වරට පිළියෙළ කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම |
| --- | --- |
| | රු. |
| ජංගම නොවන වත්කම් | 5,807,471,144 |
| ජංගම වත්කම් | 270,498,973 |
| මුළු වත්කම් | 6,077,970,117 |
| බැරකම් | |
| ජංගම බැරකම් | 1,251,436,202 |
| ජංගම නොවන බැරකම් | 346,043.456 |
| මුළු බැරකම් | 1,597,479,658 |

| | |
|---|---|
| ශුද්ධ වත්කම් / අයිතිය | 4,480,490,459 |
| මුළු බැරකම් | 6,077,970,117 |
| | |
| මුළු ආදායම | 540,846,037 |
| මුළු වියදම | (691,762,857) |
| ඌනතාවය | (150,916,820) |

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | (i). | ඉන්ධන දීමනා හා වාහන හිමිකම් දීමනා සඳහා හිමිකම් නොමැති MM වැටුප් කාණ්ඩයේ නිලධාරීන් දෙදෙනෙකු සඳහා ඉන්ධන දීමනා ලෙස රු.182,520 ක් හා ප්‍රවාහන දීමනා ලෙස රු.650,000 ක් ද වතු අධිකාරීවරුන් හතර දෙනෙකු සඳහා මාසිකව රු. 50,000 බැගින් එකතුව රු.1,150,000 ක වාහන දීමනාවක් ද සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. |
| | | (ii). | චක්‍රලේඛය ප්‍රකාරව සංස්ථාවේ සභාපතිවරයාට, ක්‍රියාකාරී අධ්‍යක්ෂ හා සාමාන්‍යාධිකාරීවරයාට මාසිකව හිමි ඉන්ධන දීමනාව පිළිවෙලින් ලීටර් 170, 150 හා 120 ක් වුවද, එම සීමාව ඉක්මවා එකතුව ඉන්ධන ලීටර් 1883 ක් සඳහා රු.208,504 ක් සමාලෝචිත වර්ෂය තුලදී වැයකර තිබුණි. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාගත් කාර්යය නිම වූ විගස පියවිය යුතු වුවද, 2017 වර්ෂයේ අවස්ථා 13 කදී ලබාගත් ගත් එකතුව රු.86,900 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා දින 30 සිට දින 224 අතර කාලයක් ගත වී තිබුණි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල දැව ගස් අලෙවි කිරීම තුලින් රු.2,166,000,000 ක ආදායමක් ලබා ගැනීමට අපේක්ෂා කලද, සමාලෝචිත වර්ෂයේදී උපයන ලද ආදායම රු.44,432,300 ක් වූ අතර එය අපේක්ෂිත ආදායමෙන් සියයට 2කි. ඒ අනුව ලඟාකර ගැනීමට නොහැකි ඉලක්ක ඇතුලත් කරමින් සංස්ථාව විසින් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණි.

(ආ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්ත අනුව, 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ හෙක්ටයාරක සම්මත වාර්ෂික නිමි තේ ඵලදාව කිලෝග්‍රෑම් 1595 ක් වුවද, සංස්ථාව විසින් පාලනය කරනු ලබන වතු 13 හි එම ඵලදාව කිලෝග්‍රෑම් 94 සිට 786 අතර පරාසයක පැවතුණි. මේ සඳහා සංස්ථාව විසින් වර්ෂ 100 කට වඩා පැරණි හෙක්ටයාර් 1478 ක ඇට තේ වගාවක් නඩත්තු කිරීම හා ඵලදාව ඉහළ රිකිලි තේ වගාව සඳහා අඛණ්ඩව යොමු නොවීම අඩු අස්වැන්නක් ලැබීමට බලපා තිබුණි.

(ඇ)2016 වර්ෂයේ තේ දළු නිෂ්පාදනය හා සසඳන විට සංස්ථාව විසින් පාලනය කරනු ලබන වතු 13 න් වතු 11 ක තේ දළු නිෂ්පාදනය ඉහළ යන විට කැලෑබොක්ක හා රංගල යන වතු දෙකෙහි දළු නිෂ්පාදනය පිළිවෙලින් සියයට 2 කින් හා සියයට 21 කින් අඩු වී තිබුණි.

(ඈ) සංස්ථාවේ ආදායම් උපයනු ලබන ඉඩම් ප්‍රමාණය වු හෙක්ටයාර් 5048.48 න් හෙක්ටයාර් 1148ක් බාහිර වැවිලිකරුවන්ට ලබා දී තිබුණු අතර, ඉන් නිෂ්පාදනය කර තිබු සමස්ථ නිමි තේ නිෂ්පාදනය 2016 වර්ෂයට සාපේක්ෂව සියයට 5කින් ඉහළ ගොස් තිබුණද, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අන්තර්ජාල පිටුවේ සඳහන්කර තිබු 2017 වර්ෂයට අදාල තේ කර්මාන්තයේ දත්තයන්ට අනුව අදාල ඉඩම් ප්‍රමාණයෙන් ලබාගත හැකි වාර්ෂික සම්මත නිමි තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 1,833,356 ක් වුවත් බාහිර වැවිලිකරුවන් විසින් නිෂ්පාදනය කර තිබුණේ එම ඵලදාවෙන් සියයට 6ක ප්‍රමාණයක් පමණි. ඒ අනුව බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබූ තේ වගා ඉඩම් ප්‍රමාණයෙන් සම්මත ඵලදාව ලබා ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි.

(ඉ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයට අදාලව අන්තර්ජාලය මඟින් නිකුත්කර තිබූ දත්තයන්ට අනුව ශ්‍රී ලංකාවේ තේ කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රු.467 ක් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව පාලනය කරනු ලබන වතු 08 ක තේ කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය රු. 530 ත් රු. 923 ත් අතර පරාසයක පැවතුණි. සංස්ථාව විසින් වාර්ෂිකව නිෂ්පාදනය සඳහා දරන වියදම්, එම වර්ෂයේ නිෂ්පාදන ප්‍රමාණයට අනුව පාලනය නොකිරීම හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඊ) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයට අදාලව අන්තර්ජාලය මගින් නිකුත්කර තිබූ දත්තයන්ට අනුව නිමි තේ කිලෝවක සම්මත සාමාන්‍ය විකුණුම් වටිනාකම රු.620 ක් විය යුතු වුවත් සංස්ථාවේ එම අගය රු.371-479 ත් අතර පරාසයක පැවතුණි. සංස්ථාව විසින් නිෂ්පාදිත තේ දළු වල ගුණාත්මක මට්ටම වැඩිකර ගැනීමට කටයුතු නොකිරීම හා සංස්ථාව සතු තේ කර්මාන්තශාලා වැඩි දියුණුකර නිෂ්පාදන කටයුතු සිදු නොකිරීම මේ සඳහා බලපා තිබුණි.

(උ) සංස්ථාවේ වතුයායන් 13කට අදාලව සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 9969.46 ක් වුවද, ඉන් ආදායම් ඉපයීම සඳහා දායක කරගෙන ඇති තේ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 5048.48 ක් පමණක් විය. ඒ අනුව සංස්ථාව සතු ඉඩම් හෙක්ටයාර් 4920.98 ක් මඟින් ආදායම් ඉපයීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1979 අංක 49 දරණ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා (සංශෝධිත) පනතේ 07(01)A වගන්තියේ (1) උප වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව සංස්ථාව සතු කිසිම නිශ්චිත දේපලක් කුලියට දීම බදුදීම විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම නොකල යුතු වුවද, විගණනය වෙත ඉදිරිපත් කළ වාර්තා අනුව ඉඩම් 19 ක් හා ගොඩනැගිලි 03 ක් බදු දීමට අදාලව අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සංස්ථාව සම්ප්‍රේෂණ කුළුණු 13 ක් සඳහා බදු දී තිබූ ඉඩම් වලින් ඉඩම් 04 ක් සඳහා රාජ්‍ය ආයතන 02 කින් හා පෞද්ගලික ආයතනයකින් 2003 වර්ෂයේ සහ 2007 වර්ෂයේ සිට අයවිය යුතු හිඟ බදු මුදල රු.21,474,353 ක් හා සන්නිවේදන කුළුණු සඳහා බදු දුන් ඉඩම් හැර බදු පදනම මත ලබා දී තිබූ ඉඩම් 14 ක් සඳහා 2011 වර්ෂයේ සිට අයවිය යුතු මුදල් රු. 34,677,907 ක් වූ අතර එය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වනවිටද කටයුතු කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේදී සංවර්ධන ස්වභාවයේ කටයුතු වලට භාවිතා කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලබාදුන් රු. මිලියන 73 ක් අක්‍රීය තත්ත්වයේ පැවති තේ කර්මාන්තශාලා සංවර්ධනය කිරීමට වැය කිරීම වෙනුවට ඉන් රු.42,981,358 ක් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පොහොර, රසායනික ද්‍රව්‍ය හා අනෙකුත් උපකරණ මිලදී ගැනීම සඳහා වැය කර තිබුණි.

(ඈ) කැලැබොක්ක කර්මාන්තශාලාව සඳහා තේ වියළුම් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2015 වර්ෂයේ සිට අවස්ථා තුනකදී මිල ගණන් කැඳවා තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල යන්ත්‍රය මිලදී ගැනීමට කටයුතුකර නොතිබුණි. මෙම යන්ත්‍රය සඳහා 2016 ජනවාරි මාසයේදී ඉදිරිපත් වී තිබූ රු.13,492,500 ක් වූ අවම ලංසු මිල 2018 මාර්තු මාසයේදී රු.26,704,840 ක් වී තිබුණි. ඒ අනුව වර්ෂ දෙකක කාලයක් තුලදී යන්ත්‍රය හා අනෙකුත් පද්ධති වල මිල ඉහළ යාම හේතුවෙන් සංස්ථාවට අමතර පිරිවැයක් දැරීමට සිදුවන අතර තවදුරටත් යන්ත්‍රය ස්ථාපිත කිරීම ප්‍රමාද වීම හේතුවෙන් නිෂ්පාදිත තේ වලට වැඩි මිලක් ලබා ගැනීමට තිබූ අවස්ථාවද සංස්ථාවට අහිමි වී තිබුණි.

(ඉ) සංස්ථාව සතු පර්ත් වත්තේ පිහිටි වොටර්ලෑන්ඩ් කොටසෙහි පවතින බංගලාව හා අක්කර 4.33 ක පවතින පොල් වගාව බාහිර පාර්ශවයක් විසින් භුක්ති විඳින අතර අදාල බංගලාව සහ එම ඉඩම සංස්ථාවට පවරා ගැනීමට හෝ බදු පදනම මත ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සංස්ථාවට අයත් ඕපල්ගල වතුයාය, පෞද්ගලික සමාගමක් වෙත බදු දීමට තීරණය කර පසුව එම තීරණය වෙනස් කලද, 2002 වර්ෂයේදී අදාල පෞද්ගලික සමාගමෙන් ලබා ගත් රු.4,480,000 ක අත්තිකාරම් මුදල ආපසු ගෙවීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.

## 3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සංස්ථාව සතුව පවතින කර්මාන්තශාලා 13 න් තේ දළු කිලෝ ග්‍රෑම් 98,500 ක දෛනික නිෂ්පාදන ධාරිතාවයෙන් යුතු කර්මාන්තශාලා 10 ක් වර්තමානය වන විට අක්‍රීය තත්ත්වයේ පැවතුණි. අක්‍රීය කර්මාන්තශාලා කිහිපයක් හෝ තේ නිෂ්පාදන කටයුතු වෙනුවෙන් දායක කර නොගැනීම හේතුවෙන් 2017 වර්ෂයේදී ලබාගත් තේ දළු කිලෝ ග්‍රෑම් 7,127,842 න් කිලෝ ග්‍රෑම් 4,011,059 ක් එනම් සියයට 56 ක ප්‍රමාණයක් බාහිර ගැණුම්කරුවන් වෙත අලෙවි කිරීමට සිදු වී තිබුණි.

## 3.4 කාර්යය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 89 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 81 ක් විය. අනුමත කාර්යය මණ්ඩලය තුල ඇතුළත් තනතුරු 15ක් පුරප්පාඩුව පවතින අතර අතිරික්ත සේවක සංඛ්‍යාව 7 ක් විය. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 5.2 ප්‍රකාරව යම් තනතුරක පුරප්පාඩුවක් ඇති වූ වහාම එම තනතුර සම්පූර්ණ කළයුතු වුවත්, පුරප්පාඩුව පවතින ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2ක් හා තෘතීය මට්ටමේ තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් තිදෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ආ) අනුමත කාර්යය මණ්ඩලය තුල නොමැති තනතුරු සඳහා සේවකයින් 04 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී රු.1,089,641 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) සංස්ථාව විසින් කාර්යය මණ්ඩලය අනුමත කර ගනු ලබන අවස්ථාවේදී පැවති කළමණාකරු (මූල්‍ය), පරිපාලන නිලධාරී සහ සහකාර පරිපාලන නිලධාරී යන තනතුරු අනුමත තනතුරු තුලට ඇතුලත් කර නොතිබුණු අතර එම අවස්ථාවේ එම තනතුරුවල සේවය කළ නිළධාරීන් ඔවුන්ගේ සුදුසුකම් මත සුදුසු තනතුරකට අනුයුක්ත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ 9.3.1 අනුව කිසියම් තනතුරකට බඳවා ගැනීම හෝ උසස් කිරීමේදී ඒ සඳහා සපුරාලිය යුතු අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ඇතුළත් අනුමත බඳවාගැනීමේ හා උසස්කිරීමේ කාර්යය පරිපාටියක් තිබිය යුතුය. එසේ වුවත් සංස්ථාව විසින් බඳවාගැනීමේ හා උසස්කිරීම් පරිපාටියක් නොමැතිව සමාලෝචිත වර්ෂය තුළ උසස් කිරීම් 19 ක් සිදුකර තිබුණු අතර උසස් කරන ලද තනතුරු වලට අවශ්‍ය සුදුසුකම් අදාල නිලධාරීන් විසින් සපුරා තිබුණේද යන්න නිශ්චය කළ නොහැකි විය.

(ඉ) ආයතන සංග්‍රහයේ VII වන පරිච්ජේදයේ 10.2 උප වගන්තිය අනුව වැටුප් වර්ධක ගෙවීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවේදී හැර අන් සෑම අවස්ථාවකම 10.1 උප වගන්තිය ප්‍රකාරව වැටුප් වර්ධක දිනට නියමිත වැටුප් වර්ධකය උපයා ගත යුතු වුවත් සංස්ථාවේ කළමණාකාරීත්වය විසින් කිසිදු ඇගයීමකින් තොරව සේවකයන් 50 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී 02 සිට10 දක්වා වූ පරාසයක වැටුප් වර්ධක ලබා දී තිබුණි. එම කළමණාකරණ තීරණය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මාස 05 කදී ගෙවා තිබූ අමතර වැටුප් වියදම රු.429,574 ක් විය.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව මාස 03 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වූවද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ලේඛන පවත්වා ගැනීම | මූලාශ්‍ර ලේඛන නිසි පරිදි නඩත්තු කර නොතිබීම. |
| (ආ) | අයවැය පාලනය | අයවැයගත ඉලක්ක සපුරාගැනීම, අධීක්ෂණය කිරීම පහළ මට්ටමක පවතින අතර, කාර්ය සාධනය වර්ධනය කර ගැනීමට අදාල තාක්ෂණික මෙවලම් භාවිතා නොකිරීම. |
| (ඇ) | සේවක කළමනාකරණය | අනුමත සේවක සංඛ්‍යාවට අමතරව සේවකයින් බඳවා ගැනීම, නිතීරීතිවලට පටහැනිව උසස් වීම් හා සේවය දීර්ඝ කිරීම් සිදු කර තිබීම සහ සේවකයින්ට නිසිපරිදි වගකීම්, රාජකාරී පවරා නොදීම. |
| (ඈ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන සැලැස්ම අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක නොකිරීම. |